www.pastpapers.wiki

**NEW**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**Department of Examinatios Sri Lanka**

**64 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
**General Certificate of Education (Ord.Level) Examination, December 2017**

| | | |
|---|---|---|
| දෙවන බස - සිංහල | I, II | පැය තුනයි |
| இரண்டாம் மொழி - சிங்களம் | I, II | மூன்று மணித்தியாலம் |
| **Second Language - Sinhala,** | **I, II** | **Three hours** |

இரண்டாம் மொழி - சிங்களம் **I**

සැලකිය යුතුයි :
(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

கவனிக்க :
(i) எல்லா வினாக்களுக்கும் விடை எழுதுக.
(ii) 1 தொடக்கம் 40 வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும் (1), (2), (3), (4) என எண்ணிடப்பட்ட விடைகளில் சரியான அல்லது மிகப் பொருத்தமான விடையைத் தெரிவுசெய்க.
(iii) உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் எண்ணை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (×) இடுக.
(iv) அவ்விடைத்தாளின் பிற்பக்கத்தில் தரப்பட்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்துப் பின்பற்றுக.

**Note :**
(i) *Answer all questions.*
(ii) *In each of the questions from* 1 *to* 40, *pick one of the alternative* (1), (2), (3), (4) *which you consider* is *correct or most appropriate.*
(iii) ***Mark a cross* (X) *on the number corresponding to your choice in the answer sheet.***
(iv) *Further instructions are given on the back of the answer sheet Follow them carefully.*

- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පදය තෝරන්න.
  1 தொடக்கம் 05 வரையுள்ள வினாக்களில் தடித்த எழுத்தில் தரப்பட்டுள்ள சொல்லுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.
  In questions 1 to 5, Select the most suitable word for the words printed in **bold letters.**

1. ඔයා උත්සවයට **එන්නැද්ද?**
(1) එන්නෙ නැති ද? (2) එන්න නැති ද? (3) එනවා නැති ද? (4) එන්ට නැති ද?

2. ඒ ගැන මගෙන් **අහන්නෙපා.**
(1) අහන් නෙපා (2) අහන්න නෙපා (3) අහන්න එපා (4) බෙහෙත් දාන්න

www.pastpapers.wiki

www.pastpapers.wiki

3. මගේ ඇහැට බෙහෙද්දාන්න.
(1) බෙහෙද් දාන්න (2) බෙහෙද්දා අන්න (3) බෙහෙද් තාන්න (4) බෙහෙත් දාන්න

4. උත්සවයට ඔයත්තෙනවා ද?
(1) ඔයත් තෙනවා ද? (2) ඔයා තෙනවා ද? (3) ඔයත් එනවා ද? (4) ඔයා එනවා ද?

5. ආප්පත්තෙක්ක ලුණුමිරිස් දෙන්න.
(1) ආප්පත් කෙක්ක (2) ආප්ප තෙක්ක (3) ආප්පත් තෙක්ක (4) ආප්පත් එක්ක

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් නිවැරදි උච්චාරණය සහිත පදය තෝරන්න.
6 தொடக்கம் 10 வரையுள்ள வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் சரியான உச்சரிப்பைத் தரும் சொல்லைத் தெரிவு செய்க.
In questions **6 to 10,** Select the word with **correct pronounciation** from the words given.

6. (1) කණාමුඩ්ඩිය (2) කණා මුට්ටිය (3) ගණා මුඩ්ඩිය (4) ගණා මුට්ටිය

7. (1) ප්‍රවේශ පත්‍ර (2) ප්‍රවේශ බත්‍ර (3) බ්‍රවේශ පත්‍ර (4) ප්‍රවේශ පත්තර

8. (1) පෝට්ඩුව (2) බෝට්ඩුව (3) බෝට්ටුව (4) පෝට්ටුව

9. (1) විතුලි උපකරණ (2) විදුලි උපගරණ (3) විතුලි උපගරණ (4) විදුලි උපකරණ

10. (1) පතිත වේදිකාව (2) පතිත වේතිකාව (3) පදික වේදිකාව (4) පදික වේතිකාව

- අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැළපෙන ප්‍රශ්නය තෝරන්න.
11 தொடக்கம் 14 வரையான ஒவ்வொரு கூற்றுக்கும் மிகப்பொருத்தமான வினாவினைத் தெரிவு செய்க.
In questions **11 to 14,** Select the **most appropriate** question for the given sentence.

11. මෙන්න පොත අරගන්න.
(1) මට පොත දෙන්න ද? (2) මට පොත දෙනවා ද?
(3) මට පොත දෙන්නම් ද? (4) මට පොත දුන්නා ද?

12. මගේ නම උදාර.
(1) ඔයාගේ නම මොකක් ද? (2) ඔයාගේ නම මොක ද?
(3) ඔයාට නම මොකක් ද? (4) ඔයාට නම මොක ද?

13. තව ටිකක් ඉස්සරහට යන්න.
(1) ෆාමසියෙන් තව යන්න ද? (2) ෆාමසිය දුර මොකක් ද?
(3) ෆාමසියට දුරක් තියෙනවා ද? (4) ෆාමසියට තව දුරයි ?

14. මම හෙට කොළඹ යනවා.
(1) ඔයා හෙට යන්නේ කීයට ද? (2) ඔයා හෙට යන්නේ කොහේ ද?
(3) ඔයා හෙට යනවා ද? (4) ඔයා හෙට යන්නේ මොක ද?

- අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදි ව අකුරු යෙදී ඇති පදය තෝරන්න.
15 தொடக்கம் 18 வரையான வினாக்களில் சரியான எழுத்துகளைக் கொண்ட சொற்களைத் தெரிவு செய்க.
In questions **15 to 17,** Select the word with **correct spelling**.

15. (1) වෛද්‍යවරයා (2) වයිද්දයවරයා (3) වෛත්‍යවරයා (4) වෛද්‍යවරයා

www.pastpapers.wiki

www.pastpapers.wiki

16. (1) පරීක්ෂණය (2) පරීක්සනය (3) පරීක්ශනය (4) පරීක්ෂනය

17. (1) පාටමාළාව (2) පාටමාලාව (3) පාඨමාලාව (4) පාඨමාළාව

- අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.
  18 தொடக்கம் 20 வரையான வினாக்களில் பொருத்தமற்ற சொல்லைத் தெரிவு செய்க.
  In questions **18** to **20**, Select the **inappropriate** word.

18. (1) සමාරම්භය (2) ආරම්භය (3) පටන් ගැන්ම (4) අවසානය

19. (1) මාළු (2) මුහුද (3) පර්වතය (4) ධීවරයා

20. (1) ගාමසිය (2) බෙහෙත් (3) රෝගය (4) විදුහල

- අංක 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට සමානාර්ථයක් දෙන පදය තෝරන්න.
  21 தொடக்கம் 23 வரையாள வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு ஒத்தகருத்தைத் தரும் சொல்லைத் தெரிவு செய்க.
  In questions **21** to **23**, select the **synonym** for the word given at the beginning.

21. ආපදාව : (1) ආහාර පාන (2) දේපළ (3) උත්සවය (4) උවදුර

22. අවවාද : (1) ඔවදන් (2) අපවාද (3) අනුවාද (4) ආදරය

23. නිවස : (1) නිරය (2) නිවහන (3) නිමාව (4) නිසල

- අංක 24 සිට 25 ප්‍රශ්න සඳහා මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්න.
  24 மற்றும் 25 ஆகிய வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு எதிர்கருத்தைத் தரும் சொல்லைத் தெரிவு செய்க.
  In questions **24** and **25**, select the **antonym** of the word given at the beginning.

24. බිම : (1) උස (2) උඩ (3) උල (4) උදය

25. දුර : (1) ළඟ (2) විදුරු (3) ඈත (4) ළය

- අංක 26 සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
  26 தொடக்கம் 28 வரையுள்ள ஒவ்வொரு வினாவிலும் தரப்பட்ட படங்களுக்கான மிகப் பொருத்தமான கூற்றைத் தெரிவு செய்க.
  In each questions **26** to **28**, select the **most suitable statement** for the picture given.

26. 
(1) අනතුරුදායක පාලම ඉදිරියෙනි.
(2) පාර මාරු වීම තහනම්.
(3) පාරේ දකුණෙන් ගමන් කරන්න.
(4) පාර මාරු වන ස්ථානය ඉදිරියෙනි.

27. 
(1) කුරුලු අභය භූමිය
(2) ඉන්ධන පිරවුම් හල
(3) තැපැල් කාර්යාලය
(4) සත්වෝද්‍යානය

www.pastpapers.wiki

www.pastpapers.wiki

28. 

(1) දුම්බීම තහනම්
(2) දුම් බොන ස්ථානය
(3) වහා ගිනි ඇවිලෙනසුලුයි
(4) දුම්වැටි විකිණීම තහනම්

- අංක 29 සිට 30 ප්‍රශ්නවලට ගැළපෙන උත්තරය තෝරන්න.
29. மற்றும் 30 ஆம் வினாக்களுக்குப் பொருத்தமான விடையைத் தெரிவு செய்க.
For questions **29** and **30**, select the **suitable answer**.

29. කාලයට ගැළපෙන යන්න සඳහා වඩාත් සුදුසු වචනය තෝරන්න.
(1) කාලත්‍රය (2) අකාලික (3) කාලනිර්ණය (4) කාලෝචිත

30. අද බදාදා නම් පෙරේදා කවරදා ද?
(1) සඳුදා (2) අඟහරුවාදා (3) සිකුරාදා (4) ඉරිදා

- අංක 31 සහ 32 යන එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස නිවැරදිව සම්බන්ධ කර ලියා ඇති වාක්‍යය තෝරන්න.
31 மற்றும் 32 ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் இணைத்து ஒரு வாக்கியமாக்கி சரியாக எழுதப்பட்ட வாக்கியத்தைத் தெரிவு செய்க.
In questions **31** and **32**, two sentences are given. select the **sentence** that correctly combines the two sentences.

31. මම බස් රථයට නැග්ගෙමි. ටිකට්පතක් මිල දී ගතිමි.
(1) මම බස් රථයට නැග්ගාම ටිකට්පතක් මිල දී ගනිමි.
(2) මම බස් රථයට නැග ටිකට්පතක් මිල දී ගතිමි.
(3) මම ටිකට්පතක් මිල දී ගෙන බස් රථයට නැග්ගෙමි.
(4) මම බස් රථයට නැග්ගාම ටිකට්පතක් මිල දී ගන්නෙමි.

32. ගං වතුර බැස ගියේ ය. ගම් වැසියෝ යළි නිවෙස්වලට ගියහ.
(1) ගංවතුර බැස ගිය පසු ගම්වැසියෝ යළි නිවෙස්වලට ගියහ.
(2) ගංවතුර බැස ගියේ ගම්වැසියෝ යළි නිවෙස්වලට ගියහ.
(3) ගංවතුර බැස ගියත් ගම්වැසියෝ යළි නිවෙස්වලට ගියහ.
(4) ගංවතුර බැස ගොස් ගම්වැසියෝ යළි නිවෙස්වලට ගියහ.

- අංක 33 සහ 34 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.
33 மற்றும் 34 ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு மிகவும் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.
In questions **33** and **34**, select the **most suitable word** for filling the blank.

33. හැම දෙනා ම ........................................................ ඉන්න.
(1) පේළියකින් (2) පේළියෙන් (3) පේළි (4) පේළියට

34. මා කියන කාරණය ........................................................ අහගන්න.
(1) හොඳින් (2) හොඳයි (3) හොඳ (4) හොඳයි ද

www.pastpapers.wiki

www.pastpapers.wiki

- 35 ප්‍රශ්නයට උත්තර සපයන්න.
35 ஆவது வினாவிற்கு விடையளிக்குக.
Answer question no. 35.

35. මේ රජු ජීවත් වූයේ වසර 1752 කට පෙර ය.
ඉහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත සංඛ්‍යාව නිවැරදිව ලියා ඇති උත්තරය තෝරන්න.
(1) එක්දහස් හත්සිය පන්සියදෙක (2) එකසිය හත්දහස් පනස්දෙක
(3) එක්දහස් හත්සිය පනස්දෙක (4) එක්දහස් හත්දහස් පනස්දෙක

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
36 தொடக்கம் 40 வரையான வினாக்களில் இலக்கண ரீதியாக சரியான வாக்கியத்தைத் தெரிவு செய்க
In questions from **36** to **40**, select the **gramatically correct** sentence.

36. (1) මම චාරිකාවට සහභාගි වූයෙමි. (2) මා චාරිකාවට සහභාගි වූයෙමි.
(3) මම චාරිකාවට සහභාගි වූයේ ය. (4) මා චාරිකාවට සහභාගි වූයේ ය.

37. (1) වෙළෙඳ ව්‍යාපාරිකයෝ උත්සවයට ආධාර ලබා දෙයි.
(2) වෙළෙඳ ව්‍යාපාරිකයෝ උත්සවයට ආධාර ලබා දෙති.
(3) වෙළෙඳ ව්‍යාපාරිකයන් උත්සවයට ආධාර ලබා දෙයි.
(4) වෙළෙඳ ව්‍යාපාරිකයන් උත්සවයට ආධාර ලබා දෙති.

38. (1) සියලු දෙනාගේ ම උදවු අපට ලැබෙන්නෙමු.
(2) සියලු දෙනාගේ ම උදවු අපට ලැබෙති.
(3) සියලු දෙනාගේ ම උදවු අපට ලැබෙයි.
(4) සියලු දෙනාගේ ම උදවු අපට ලැබෙන්නෝ ය.

39. (1) ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දුන්හ.
(2) ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දෙන්නෙමු.
(3) ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දුන්නේ ය.
(4) ප්‍රේක්ෂකයන් ඔල්වරසන් දුන්නේ ය.

40. (1) ශිෂ්‍යාවක් නර්තනයක් ඉදිරිපත් කළේ ය.
(2) ශිෂ්‍යාවක නර්තනයක් ඉදිරිපත් කළේ ය.
(3) ශිෂ්‍යාවක නර්තනයක් ඉදිරිපත් කළා ය.
(4) ශිෂ්‍යාවක් නර්තනයක් ඉදිරිපත් කළා ය.

www.pastpapers.wiki

www.pastpapers.wiki

**දෙවන බස - සිංහල II**
**இரண்டாம் மொழி - சிங்களம் II**
**Second Language - Sinhala II**

- I කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළු ව II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් උත්තර ලියන්න.
பகுதி I இல் 1 ஆம் 2 ஆம் வினாக்கள் உட்பட பகுதி II இல் ஒரு வினாவையும் பகுதி III இல் இரு வினாக்களையும் தெரிவுசெய்து எல்லாமாக ஐந்து வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.
Answer only **five** questions including questions **1** and **2** in Part **I** and selecting **one** question from Part **II two** questions from Part **III**.

## I කොටස/ பகுதி I /Part I

1. දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් එකක් ගැන වචන 100ක පමණ රචනයක් ලියන්න.
பின்வரும் தலைப்புகளுள் ஒன்றைத் தெரிவு செய்து அதன் கீழே தரப்பட்ட விடயங்களை உள்ளடக்கி ஏறத்தாழ 100 சொற்களில் அமையுமாறு கட்டுரை எழுதுக.
Write an essay of about **100 words** on any **one** of the following topics in accodance with the given guide lines.

(අ). සමගියෙන් හා සාමයෙන් ජීවත් වෙමු
- (i) සමගිය හා සාමය පිළිබඳ හැඳින්වීම
- (ii) සමගියෙන් හා සාමයෙන් ජීවත් වීමේ වැදගත්කම
- (iii) සමගිය හා සාමය නැති වීමට හේතු
- (iv) සමගියෙන් හා සාමයෙන් ජීවත් වීමට අපට කළ හැකි දේ
- (v) සමාලෝචනය

(ආ) මාර්ග අනතුරු වළක්වා ගනිමු
- (i) මාර්ග අනතුරු පිළිබඳ හැඳින්වීම
- (ii) මාර්ග අනතුරු නිසා අත්වන ප්‍රතිඵල
- (iii) මාර්ග අනතුරු ඇති වීමට හේතු
- (iv) මාර්ග අනතුරු වළක්වා ගැනීමට කළ යුතු දේවල්
- (v) සමාලෝචනය

(ඉ) පොත් කියවමු. දැනුම ලබමු
- (i) හැඳින්වීම
- (ii) පොත් කියවීම පිළිබඳ වර්තමාන තත්ත්වය
- (iii) පොත් කියවීමෙන් ලැබෙන ප්‍රයෝජන
- (iv) පොත් කියවීමට පෙලඹවීම සඳහා කළ හැකි දේ
- (v) සමාලෝචනය


(ඊ) වැඩිහිටියන්ට ගරු කරමු
- (i) වැඩිහිටියන් යනු කවුරුන් ද?
- (ii) වැඩිහිටියන්ට අද අත් වී ඇති තත්ත්වය
- (iii) වැඩිහිටියන් රැක බලා ගත යුත්තේ ඇයි?
- (iv) වැඩිහිටියන් වෙනුවෙන් අපට කළ හැකි දේ
- (v) සමාලෝචනය

(උ) මා ගුරුවරයකු වුණොත්
- (i) කල්පිත මාතෘකාවක් ලෙස සලකා රචනයට අදාළ පසුබිම සකස් කිරීම
- (ii) ගුරුවරයකු වීමට ලැබුණොත් කරන දේවල් උපකල්පනය කිරීම
- (iii) ගුරුවරයකු බවට පත් වීම
- (iv) ගුරුවරයකු වීම නිසා සතුටට පත් වීම
- (v) සමාලෝචනය

www.pastpapers.wiki

www.pastpapers.wiki

2. දී ඇති පින්තූරය බලා, ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය පහක් ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන හතරක්වත් තිබිය යුතු ය.)
தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள ஐந்து வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்பட்சம் நான்கு சொற்களாவது இருத்தல் வேண்டும்.)
Compose **five** meaningfull sentences with reference to the given picture.
(There should be at least **four** words in a sentence.)



**II කොටස/ பகுதி II /Part II**

- 3 හා 4 යන ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර සපයන්න.
3 ஆம் 4 ஆம் வினாக்களுள் ஏதேனும் ஒரு வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
From questions **3** and **4**, answer only **one** questions.

3. පහත සඳහන් කවි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் கவிதையை வாசித்து, அதன் கீழ் வினவப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following poem and answer the questions given.

මේ රට මගෙ රට
මා ඉපදුණු රට
හැදෙන වැඩෙන රට
මගේ ම මව් රට

සරුපස පොළොවෙන්
වැහි බිඳු අහසෙන්
මිණි කැට මුතු කැට
ඇත මගෙ සිරිලක

මගෙ සිරිලක ගැන
ලොවට කියමි මම
සුරපුරයක් වෙන
ලොවේ මෙවැනි නැත

එඩිතරකම ඇති
කම්මැළිකම නැති
ළමයි සිටින රට
මගෙ මේ සිරිලක

ඒ. ජේ. ජේ. ජවාන්

www.pastpapers.wiki

www.pastpapers.wiki

(i) අහසෙන් ලැබෙන්නේ මොනවා ද?
(ii) මිණි කැට යන පදයේ තේරුම ලියන්න.
(iii) දිව්‍ය ලෝකයක් යන්නට කවි පෙළේ යෙදී ඇති වචනය ලියන්න.
(iv) එඩිතරකම ඇත්තේ කවුරුන් හට ද?
(v) මේ කවි පෙළෙන් කියැවෙන්නේ කුමක් ගැන ද?

4. පහත දැක්වෙන නිවේදනය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் அறிவித்தலை வாசித்து அதன் கீழ் வினவப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Answer the given questions with reference to the following notice.

කරුණාවෙන් සවන් දෙන්න.

මේ නිවේදනය විදුහලේ ශිෂ්‍ය නායකනායිකාවන්ටයි.

අප විදුහලේ වාර්ෂිකව පවත්වන ගුරු උපහාර උලෙළ මෙවරත් ඔක්තෝබර් මාසයේ හයවන දා පැවැත්වේ. ඒ පිළිබඳ සාකච්ඡාවක් අද පස්වරු 2.00ට ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට නියමිත ය. මෙම සාකච්ඡාවට සහභාගි වන ලෙස සියලු ම ශිෂ්‍ය නායකනායිකාවන්ට මෙයින් දනුම් දෙමු.

(i) මෙම නිවේදනය කරන්නේ කවුරුන් හට ද?
(ii) ගුරු උපහාර උලෙළ වසරකට කී වරක් පවත්වන්නේ ද?
(iii) ගුරු උපහාර උලෙළ පවත්වන්නේ කවරදා ද?
(iv) සාකච්ඡාව පැවැත්වෙන්නේ කොහේ ද?
(v) නිවේදනය සිදු කිරීමේ ප්‍රධාන අරමුණ කුමක් ද?

## III කොටස/ பகுதி III /Part III

5 හා 6 යන ප්‍රශ්න දෙකට ම උත්තර සපයන්න.
5 மற்றும் 6 ஆகிய இரண்டு வினாக்களுக்கும் விடை எழுதுக.
Answer **both** questions **5** and **6**.

5. කේ. ක්‍රිෂ්ණකුමාර් අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත්ව සිටින, පරිගණක මෘදුකාංග පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් ද හදාරා ඇති අයෙකි. රාධා පරිගණක ආයතනයේ පරිගණක ක්‍රියාකරු තනතුර සඳහා අයදුම් කිරීමට ඔහු අපේක්ෂා කරයි.

කේ. ක්‍රිෂ්ණකුමාර් ඔබ යැයි සිතා අදාළ තොරතුරු ඇතුළත් අයදුම් පත්‍රයක් සකස් කරන්න.
கே, கிருஸ்ணகுமார் நீங்களெனக் கருதிக்கொண்டு. உரிய தகவல்களை உள்ளடக்கிய விண்ணப்பப்படிவம் ஒன்றைத் தயாரிக்குக.
Prepare an application with relevant information assuming that you are K. Krishnakumar.

නැතහොත්
அல்லது
Or

සමගිපුර පාසලේ ශිෂ්‍යශිෂ්‍යාවන් කොළඹ වරාය නැරඹීම සඳහා අධ්‍යාපන චාරිකාවක් සැලසුම් කර ඇති අතර මේ සඳහා 2018 පෙබරවාරි 27 දින යොදාගෙන ඇත. කොළඹ වරාය නැරඹීමට අවසර ලබා ගැනීම සඳහාත් නැරඹිය හැකි ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහාත් වරාය අධිකාරිතුමා වෙත ලිපියක් යැවීමට විදුහල්පතිවරයා අදහස් කරයි.

පාසලේ විදුහල්පති මාධව බණ්ඩාර ඔබ යැයි සිතා අදාළ ලිපිය ලියන්න.
பாடசாலையின் அதிபர் மாதவ பண்டார நீங்களெனக் கருதிக்கொண்டு உரிய கடிதத்தை எழுதுக.
Write the relevant letter, assuming that you are Madhawa Bandara, the school principal.

www.pastpapers.wiki

www.pastpapers.wiki

6. පහත දැක්වෙන දෙමළ/ඉංග්‍රීසි වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் / ஆங்கில வாக்கியங்களை சிங்களத்தில் மொழி பெயர்க்க.
Translate the following Tamil/English sentences into **Sinhala.**

(i) என்னால் நன்றாகப் பாட முடியும்
(ii) எனக்கு பதினாறு வயதாகிறது.
(iii) எனது தந்தை ஓர் ஆசிரியர் ஆவார்.
(iv) நீங்கள் எத்தனை மணிக்கு வீட்டுக்கு வருவீர்கள்?
(v) கடற்கரை மிக அழகானது.

(i) I can sing well.
(ii) I am sixteen years old.
(iii) My father is a teacher.
(iv) At what time are you coming home?
(v) Seashore is beautiful.

නැතහොත්
அல்லது
Or

ඔබ විද්‍යාලයේ ශිෂ්‍ය නායකනායිකාවන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට ඔබ ඉදිරිපත් වූයේ යැයි සිතන්න. විදුහල්පතිතුමා ප්‍රමුඛ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණය මෙහෙයවනු ලබයි.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී ඔබ සහ විදුහල්පතිතුමා අතර ඇති වන සංවාදය ලියන්න.

நேர்முகப் பரீட்சைக்குக் குழுவில் உங்களுக்கும் அதிபருக்கும் இடையில் நடைபெறும் உரையாடலை எழுதுக.

Write a dialogue that take place between you and the principal at the interview board.
(i) සුභ පැතීම
(ii) විදුහල්පතිතුමා ඔබෙන් තොරතුරු විමසීම
(iii) විදුහල්පතිතුමා අසන ප්‍රශ්නවලට ඔබ දෙන පිළිතුරු
(iv) ශිෂ්‍ය නායකයකු වීමට ඔබට ඇති සුදුසුකම් ඉදිරිපත් කිරීම
(v) ස්තුති කිරීම

www.pastpapers.wiki

www.pastpapers.wiki

# අ.පො.ස. (සිංහල) දෙවන බස සිංහල - 2017

## I කොටස

| | | |
|---|---|---|
| 1 - 1 | 16 - 1 | 31 - 2 |
| 2 - 3 | 17 - 3 | 32 - 1 |
| 3 - 4 | 18 - 4 | 33 - 4 |
| 4 - 3 | 19 - 3 | 34 - 1 |
| 5 - 4 | 20 - 4 | 35 - 3 |
| 6 - 2 | 21 - 4 | 36 - 1 |
| 7 - 1 | 22 - 1 | 37 - 2 |
| 8 - 3 | 23 - 2 | 38 - 3 |
| 9 - 4 | 24 - 2 | 39 - 1 |
| 10 - 3 | 25 - 1 | 40 - 4 |
| 11 - 2 | 26 - 4 | |
| 12 - 1 | 27 - 3 | |
| 13 - 4 | 28 - 1 | |
| 14 - 2 | 29 - 4 | |
| 15 - 4 | 30 - 1 | |

(ලකුණු 1 × 40 = 40 යි)

www.pastpapers.wiki

www.pastpapers.wiki

# අ.පො.ස. (සිංහල) දෙවන බස සිංහල - 2017

## II කොටස

## 1 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

### (අ) සමගියෙන් හා සාමයෙන් ජීවත් වෙමු

සමගියෙන් සාමයෙන් ජීවත්වීම රටක් ලෙස අපගේ දියුණුවට මනාව හේතු වේ. බෙදුම්වාදිකම්වලින් තොරව සියලු දෙනාම එක්ව සහයෝගයේ යුතුව කටයුතු කිරීම වැදගත් ය. එසේ සාමයෙන් සහ සමගියෙන් සිටිනතාක් කල් සතුටෙන් සංයමයෙන් කටයුතු කිරීමට හැකිවේ.

අපේ පැරණි කියමනක් වන 'සමගිය බලය වේ' අසමගිය දුක වේ යනුවෙන් සඳහන් වන්නේද සමගියේ අගය කොපමණද යන්න කියා පෑමට ය. සාමයෙන් සමගියෙන් ජීවත්වනතාක් කල් අපව පැරදවීමට හෝ අපව අභිබවා යාමට කිසිවෙකුටත් නොහැක. එයට හොඳම උදාහරණය නම් ගොවියෙක් තම කුඹුර වටුකුරුල්ලන්ගෙන් ආරක්ෂා කිරීමට දැලක් එළා තබයි, වටුකුරුලු රංචුවේ තිබූ සමගිය නිසා කුරුලු රංචුව එක්ව දැලද රැගෙන පියඹා යති. ඒ තරමට ම සමගිය මහා බලයක් වේ.

එහෙත් වර්තමානයේ ජාති, ආගම්, කුල ගෝත්‍ර ලෙස මිනිසුන් බෙදී ඇත. එකම රටක පටු අරමුණු පෙරටු කරගෙන මිනිසුන් බෙදීමකට ලක් වී ඇත. ධනයට බලයට කෑදර වන මිනිසා තම මානුෂීය ගතිගුණ පසෙකලා දුවන්නන් වාලේ ඔහේ දිව යයි. නවීන සමාජයේ මුදලට සියල්ලම තීරණය වෙමින් පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසා ඕනෑම අධම වැඩක් කිරීමට පෙළඹී ඇත.

සාමයෙන් සමගියෙන් ජීවත්වීමට සහ එහි අගය සමාජයට වටහා දීමට උත්සහා ගත යුතුය. වසර තිහක කුරිරු යුද්ධයත් සමඟ අප රටක් ලෙස පීඩාවන් රැසකට ම ගොදුරු වුයෙමු. එවන් තත්ත්වයන් යළි ඇති නොවීමට පියවර ගත යුතුය. පාසල් මට්ටමේ සිටම ළමුන්ට සමගියේ අගය පිළිබඳ කියා දිය යුතුය. රට මෙහෙවන රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී පක්ෂ පාට භේදවලට ඉඩ නොතබා සාමය සමගිය අගය කිරීමට සමාජය පෙළඹවිය යුතුය. රටක් ලෙස දියුණු විය හැක්කේ සාමය සමගිය අගයනතාක් කල් පමණක් බව ජනතාව දැනුවත් කළ යුතුය. ආර්ථික, සමාජ, සංස්කෘත සහ මිනිස් කායික හා අධ්‍යාත්මික සැනසුම රඳා පවතින්නේ සාමය හා සමගිය මතය.

එහෙයින් අප සැම දෙනාම එක්ව අත්වැල් බැඳගත් සාමයෙන් සමගියේ ජීවත් විය හැකි රටක් ගොඩනැගීමට වෙහෙසෙමු.

### (ආ) මාර්ග අනතුරු වළක්වා ගනිමු

මහා මාර්ගයේ ගමන් කිරීමේ අටියෙන් මාර්ග නීති පද්ධතියක් හඳුන්වා දී ඇත. එම නීති අබිබවා වාහන ධාවනය කිරීම සහ පදික වේදිකාවේ ගමන් කිරීම නිසා මාර්ග අනතුරු ඇතිවේ.

මාර්ග අනතුරු නිසා අත්වන අයහපත් ප්‍රතිඵල රැසකි. මිනිස් ජීවිත අකාලයේ විනාශ වී යන අතරම මිනිසා ශරීරික ලෙස දැඩි රෝගාබාධවලට ගොදුරු වේ. එසේම භෞතික සම්පත් විනාශ වී යයි. මාර්ග අනතුරු නිසා රටේ මාර්ග පද්ධතිය ගැන බොහෝ මතභේදාත්මක කාරණ පැතිර යයි.

මාර්ග අනතුරු ඇතිවීමට හේතු ගණනාවක්ම බලපානු ලබයි ඒ අතර අධික වේගයෙන් වාහන ධාවනය කිරීම, බීමත්ව වාහන පැදවීම, කිසිදු පුහුණුකමකින් තොරව වාහන පැදවීම, මාර්ග සංඥාවලට අවනත නොවීම, නොසැලකිලිමත්කම, මාර්ගයේ සෑම තැනක්ම පාර මාරු වීමට යොදා ගැනීම, පදික වේදිකාවේ වාහන ධාවනය කිරීම ආදි කරුණු රැසක් මේ සඳහා බලපායි. එසේ මාර්ග සංඥාවල දෝෂ, මාර්ගවල තිබෙන අබල දුබලතාද මේ සඳහා බලපායි.

වර්තමානය වන විට මාර්ගයට එක් වී ඇති වාහන ප්‍රමාණය නිසාවෙන් දිනෙන් දින මාර්ග අනතුරු සුලබ වීමේ අවධානමක් පවතියි. එහෙයින් ඉතාමත්ම සංයමයෙන් මාර්ග නීතිවලට ගරු කරමින් පාරේ ගමන් කළ යුතුය. ඒ තුළින් මාර්ග අනතුරු වළක්වා ගැනීමේ හැකියාව ඇත. කුඩා අවධියේ සිට මාර්ග නීති සහ මාර්ග සංඥාවලට

ඒ. ජේ. ජේ. ජවාන්

www.pastpapers.wiki

www.pastpapers.wiki

අනුකූලව පාරේ ගමන් කිරීමට මෙන්ම වාහන ධාවනය කිරීමට පුරුදු පුහුණු කළ යුතුය. මාර්ග අනතුරුවලින් වන හානිය පිළිබඳව සමාජය දැනුවත් කළ යුතුය. තවද වඩා හරවත් මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීමටද වග බලා ගත යුතුය.

මෙම කරුණු සැලකිල්ලට ගෙන මාර්ගය භාවිත කරන්නේ නම් මාර්ග අනතුරු රැසක් වළක්වා ගත හැකි ය.

## (ඉ) පොත් කියවමු. දැනුම ලබමු

'කියවීම මිනිසා සම්පූර්ණ කරයි' යන කියමනට අනුව කියවීම තුළින් මිනිසාට කොතරම් ඵල ප්‍රයෝජන අත්වන්නේ ද යන්න මනාව පැහැදිලි වේ. ලොකු කුඩා භේදයකින් තොරව අප සියලුම දෙනා කියවීමේ පුරුද්ද ඇති කර ගත යුතුය. පොතක් කියවීම තුළින් ලබන්නාවූ මානසික සුවය වෙන කිසිදු දෙයකින් ලැබිය නොහැක.

වර්තමානයේ දියුණු තාක්ෂණය සමග මිනිසුන් දැඩි බැඳීමක් ඇති කරගෙන සිටිති. එහි ප්‍රතිඵලයක් ලෙස කාර්ය බහුල සමාජ රටාව තුළ face book, Intenet, e mail, E - book ආදි විද්‍යුත් මාධ්‍ය ක්‍රම සඳහා යොමු වී ඇත. ඒ හේතුවෙන් පොත් කියවීම සමාජයෙන් දුරස් වී ගොස් ය.

පොත් කියවීමෙන් ලැබෙන්නා වූ ඵල ප්‍රයෝජන රැසකි. කියවීම මිනිසා සම්පූර්ණ කරයි යන්න ප්‍රධාන වේ. පොත් කියවීමෙන් දැනුමෙන් සන්නද්ධ මිනිසෙකු බිහිකර ගැනීමට හැකිවේ. එසේම කියවීම පුද්ගලයා තුළ සංයමය ඇති කිරීමට හේතු වේ. සමාජය ගවේෂණය කළ හැකි වෙනවා මෙන්ම සාහිත්‍යයේ රසය විඳීමටද අවකාශය ලැබේ. ධාරණ ශක්තිය වැඩි දියුණු කරගෙන පිරිපුන් මනසකට හිමිකම් කීමේ අවස්ථාව අපට හිමිවන්නේ පොත් කියවීම තුළිනි. ලොකු කුඩා භේදයකින් තොරව සියලුම දෙනා පොත් කියවීමට යොමුවන්නේ නම් එය ඉතා වැදගත් ය. අවියකට කළ නොහැකි බොහෝ දේ පොතකට කළ හැකි බව බොහෝ උගතුන් පවසා ඇත්තේ ඒ නිසාමය. කායික මානසික දියුණුවට පොත් කියවීම තුළින් ඉටු වන්නේ ඉමහත් මෙහෙයකි.

කුඩා කළ සිටම සමාජය පොත්පත් කියවීමට යොමු කළ යුතුය. එවිට වඩා හරවත් සමාජයක් බිහිවනු ඇත. පොත් කියවීමේ අගය පිළිබඳ සමාජය දැනුවත් කළ යුතුය. පාසල්වල කියවීමේ රුචිය ඇති කිරීමට යම් යම් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. ජාතික මට්ටමින් කියවීමට ළමුන් පොළඹවන ආකාරයේ තරග පැවැත් විය යුතුය. වඩා ගුණාත්මක පොත් පත් නිර්මාණය කළ යුතුය. එසේම පුස්තකාල සඳහා අවශ්‍ය පහසුකම් ලබාදී කියවීමට ළමුන් දිරිමත් කළ යුතුය. මෙසේ විවිධාකාර වැඩසටහන් ඔස්සේ පොත් පත් කියවීමට සමාජය යොමු කළ යුතුය.

එවිට මනා සංයමයකින් යුත් මානුෂීය ගුණධර්ම ගරු කරන බුද්ධිමත් සමාජයක් බිහිවනු ඇත.

## (ඊ) වැඩිහිටියන්ට ගරු කරමු

වැඩිහිටියන්ට සැලකීම ඉතාමත්ම උතුම් ගුණාංගයකි. වැඩිහිටියන් යනු අපට වඩා වයසින් ගුණ නුවණින් යුත් පිරිසකි. ඔවුනට සැලකීම අපගේ යුතුකම සහ වගකීම වන්නේ ය. අපේ දෙමව්පියන්, ගුරුවරුන් සහ වයසින් ගුණ නුවණින් පිරි අය වැඩිහිටියන් ලෙස සලකා ගරු කළ යුතුය.

වර්තමානය වන විට වැඩිහිටියන් සමාජයේ හුදකලාව අසරණ වී ඇත. ඔවුන් වයසින් මුහුකුරා යනවාත් සමගම තම කටයුතු පවා කරගැනීමට නොහැකි තත්ත්වයට පත් වේ. එවිට අප ඔවුන් දෙස විමසිල්ලෙන් බැලිය යුතුය. වර්තමානයේ දරුවන් වැඩිහිටියන්ට ගරු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රට පුරා වැඩිහිටි නිවාස බිහි වී ඇත. මානුෂීය ධර්මතා ගිලිහී ගිය සමාජයක දරුවන්ට රාජකාරි බහුල වී ඇත. ඒ නිසාවෙන් වැඩිහිටියන් ගැන සොයා බලන්නට කාලය වැය කිරීමට පවා නොහැකි වේ. එවිට වැඩිහිටියන්ට වැඩිහිටි නිවාසවල පිහිට පැතීමට සිදු වේ.

වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීම තමන්ගේ අභිවෘද්ධියට හේතු වේ. තමන් හදාවඩාගත් තමන්ට ශිල්ප ශාස්ත්‍රය කියා දුන්, තමන්ට හොඳ නරක කියාදී නිසි මග පෙන්වන වැඩිහිටියන්ට නිරන්තරයෙන්ම අප ගරු කළ යුතුය.

වැඩිහිටියන් රැක බලා ගැනීම අපගේ යුතුකම හා වගකීම වන්නේ ය. වැඩිහිටියන් තම ජීවිතයේ හොඳම කාලය කැප කර අපව මේ තත්ත්වයට ගෙන ඒමට මහන්සි වී ඇත. එහෙව් වැඩිහිටියන් දුබල තත්ත්වයට පත් වූ විට ඔවුන් රැක බලා ගැනීමට අපට හැකි විය යුතුය.

වැඩිහිටියන් වෙනුවෙන් අපට කළ හැකි දේ බොහෝ ය. ඔවුන් ළඟින් සිට ඔවුන්ගේ අවශ්‍ය සොයා බැලිය යුතුය. එපමණක් නොව ඔවුන්ගේ පාළුව, කාන්සිය දුරු කිරීමට ඔවුන් හා සුහදව කථා බහ කිරීම වටියි.

www.pastpapers.wiki

www.pastpapers.wiki

ජීවිතේ අවසන් සමය සියලු දෙනා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔවුන් කැමතිය. ඔවුන් කෙරෙහි නිරන්තර අවධානයෙන් සිටීම වැදගත් ය.

ආගමික ශාස්තෘතෘවරුන් පවා දේශනා කර ඇත්තේ වැඩිහිටියන්ට ගරු කිරීම උතුම් ගුණාංගයක් ලෙසය. එහෙයින් වැඩිහිටියන්ට සැලකීමට අපත් පුරුදු වෙමු.

## (උ) මා ගුරුවරයකු වුණොත්

ගුරු වෘත්තිය වනාහි ඉතාම තෘප්තිමත් මෙන්ම සමාජ සේවයක් වන වෘත්තියකි. ගුරුවරයා සිසුවාගේ මණැස පෑදීමට සමත් වන්නේ ය. පුද්ගලයා සමාජශීලි යහපත් පුරවැසියකු වීමේ ගෞරවය හිමිවන්නේ ගුරුවරුන්ට ය. දෙවනි මවුන් ලෙස සලකන්නේ අපේ ගුරු මව්පියවරුන් ය.

ගුරුවරයකු වීමට හැකිවීම තරම් භාග්‍යයක් වෙන නැති තරම් ය. මා හට ගුරුවරයෙකු වීමට ලැබුණ හොත් මා සතු වගකීම උපරිමයෙන්ම ඉටු කිරීමට වෙහෙසෙමි. ජාති ආගම්, කුල භේදයකින් තොරව සෑම ළමයකුටම එක සමාන ලෙස සලකමි ඉගැනීම් කටයුතුවලට අමතරව සමාජය ගැන දැන කියා ගත යුතු බොහෝ දේ උගන්වමි. විභාග මත පදනම් වූ මිනිසෙක් නොව සමාජශීලි පුරවැසියකු බිහිකිරීමට කැපවෙමි. ලංකාවේ ඕනෑම පාසලක සේවය කිරීමට බැඳී සිටිමි.

මා කුඩා කල සිටම ප්‍රාර්ථනා කළේ ගුරුවරයකු වීමටයි. ඒ සඳහා මම දැඩි වෙහෙසක් දැරුවෙමි. එහි ප්‍රතිඵලයක් ලෙස ගුරුවරයකු වීමේ භාග්‍යය මා හට උදා විය.

ගුරුවරයකු ලෙස ළමුන් සමග ගෙවන මෙම වෘත්තියට මා මහත් සේ ඇලුම් කරමි. ගුරු වෘත්තිය මොනතරම් ආත්ම තෘප්තියක් ගෙන එන රැකියාවක් දැයි සිතේ. අහිංසක දරු දැරියන්ට යහපත් සමාජයක් ගොඩනගාදීම තරම් සැනසීමක් වෙන නැත. වෛද්‍ය, ඉංජිනේරු, නීතිඥ, හෙද, යන ඕනෑම කෙනෙක්ගේ පැවැත්ම තීරණය වන්නේ ගුරු භූමිකාව මත ය.

එබැවින් ගුරුවරයා වනාහි උත්තරීතර පුද්ගලයකු සමාජයේ ගෞරවාදරයට ලක්විය යුත්තකි. සමාජයට දැනුම බෙදා හරින්නෙකි. සමාජය දෙස විවෘත, නව මනසකින් දිවැස් හෙළන්නෙකි. මේ නිසා ගුරුවෘත්තිය මෙලොව ඇති වෘත්තීන් අතර හොඳම වෘත්තිය ලෙස මම සලකමි. එය මට හැකි උපරිම අයුරින් කිරීමට මම බැඳී සිටින්නෙමි.

**(මුළු ලකුණු 20 යි)**

## 2 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

(i) වෛද්‍යවරයා විසින් රෝගියා පරීක්ෂා කරනු ලබයි.

(ii) රෝගියා තරමක් බියට පත්වී සිටින්නේ ය.

(iii) රෝගියාගේ පියා පසෙකට වී බලා සිටියි.

(iv) වෛද්‍යවරයා රෝගය ගැන පැහැදිලි කරමින් සිටියි.

(v) හාත්පස පරිසරයෙන් වෛද්‍ය උපකරණ බෙහෙත් වර්ග ආදිය දක්නට ලැබේ.

**(ලකුණු 2 × 5 = 10 යි)**

## 3 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

(i) වැහි බිඳු / වැස්ස

(ii) මැණික්

(iii) සුරපුරයක්

(iv) ළමයින්ට

(v) ශ්‍රී ලංකාව /මගේ රට

**(ලකුණු 2 × 5 = 10 යි)**

ඒ. ජේ. ජේ. ජවාන්

www.pastpapers.wiki

www.pastpapers.wiki

## 4 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

(i) සියලුම ශිෂ්‍ය නායක නායිකාවන්ට
(ii) එක් වරක්
(iii) ඔක්තෝබර් හයවන දා
(iv) ප්‍රධාන ශාලාවේදී
(v) ගුරු උපහාර උළෙල ගැන සාකච්ඡාවට සියලුම ශිෂ්‍ය නායක නායිකාවන් කැඳවීමට

(ලකුණු 2 × 5 = 10 යි)

## 5 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

### අයදුම් පත්‍රය

රාධා පරිගණක ආයතනයේ පරිගණක ක්‍රියාකරු තනතුර සඳහා

1. සම්පූර්ණ නම :- කේ. ක්‍රිෂ්ණකුමාර්
2. වයස :- අවුරුදු 22 යි
3. උපන් දිනය :- 1996.05.12
4. ලිපිනය :- අංක 05, කුමාරතුංග මාවත, පානදුර
5. දුරකථන :- 0713815900
6. අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස උසස් පෙළ සහ අ.පො.ස සා.පෙළ සමත්

| සා.පෙළ | ප්‍රතිඵල |
|---|---|
| සිංහල | C |
| ගණිතය | B |
| විද්‍යාව | B |
| ඉතිහාසය | A |
| සෞඛ්‍යය | A |
| දෙමළ | A |
| ඉංග්‍රීසි | B |
| සංගීතය | B |

5. වෙනත් සුදුසුකම :- පරිගණක මෘදුකාංග පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ඇත.

ඉහත තොරතුරු සත්‍ය බව සහතික කරමි.

2018.02.17 ............................ Gajendry ............................

දිනය අත්සන

(මුළු ලකුණු 10 යි)

www.pastpapers.wiki

www.pastpapers.wiki

විදුහල්පති,
මාධව බණ්ඩාර,
සමගිපුර මධ්‍ය විද්‍යාලය.
සමගිපුර
2018.02.17

වරයා අධිකාරිතුමා,
කොළඹ වරයා,
කොළඹ.

මහත්මයාණෙනි,

<u>වරාය නැරඹීමට අවසර ලබාගැනීම</u>

අප විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොළඹ වරාය නැරඹීම සඳහා 2018 පෙබරවාරි 27 වන දින අධ්‍යාපන චාරිකාවක් සැලසුම් කර ඇත.

එබැවින් කොළඹ වරාය නැරඹීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර නැරඹිය හැකි ස්ථාන පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙසින් කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තූතියි,
මෙයට,

Madawa banda
..........................
මාධව බණ්ඩාර,
විදුහල්පති
සමගිපුර මධ්‍ය විද්‍යාලය

**(මුළු ලකුණු 10 යි)**

## 6 වන ප්‍රශ්නය සඳහා වූ පිළිතුරු

i.

ii.

iii.

iv.

v.

i. මට හොඳින් ගායනා කළ හැකි ය.

ii. මට අවුරුදු 16 යි.

iii. මගේ පියා ගුරුවරයෙක්

iv. ඔබ ගෙදර එන්නේ කියට ද?

v. මුහුදු වෙරළ ලස්සනයි.

**(ලකුණු 2 × 5 = 10 යි)**

www.pastpapers.wiki

www.pastpapers.wiki

| | | |
|---|---|---|
| කසුන් | :- | සුබ උදෑසනක් වේවා සර්! |
| විදුහල්පතිතුමා | :- | එසේම වේවා, වාඩිවෙන්න. |
| කසුන් | :- | ස්තුතියි සර්, මම කසුන් සමරතුංග |
| විදුහල්පතිතුමා | :- | හ්.... ඔබ 40km වැඩි දුරක ඉඳන් තමයි මේ පාසලට පැමිණෙන්නේ? උදේම එන්න පුළුවන් ද? |
| කසුන් | :- | ඔව් සර්, මම මේ, මාසයේ සිට පාසල් නේවාසිකාගාරයේ නවතිනවා. |
| විදුහල්පතිතුමා | :- | බොහොම හොඳයි, කොහොමද අධ්‍යාපන කටයුතු ? |
| කසුන් | :- | සර් මම හයවසරේ සිට මේ දක්වා නොකඩවා පන්තියේ ප්‍රථමස්ථානය ලබාගෙන තිබෙනවා. |
| විදුහල්පතිතුමා | :- | ආ ...................... සතුටුයි, ශිෂ්‍ය නායකයකු වීමට ඔබට ඇති සුදුසුකම් මොනවද? |
| කසුන් | :- | සර් මම මේ වන විටත් පාසලේ විද්‍යා සංගමය, තූර්ය වාදක කණ්ඩායම, සාහිත්‍ය සංගමය ආදි සංගම් කිහිපයකම නායකත්වය දරනවා. |
| විදුහල්පතිතුමා | :- | ආ................. හොඳ නායකයෙක්.... හරි එහෙනම් අපි තීරණය පසුව දනුම් දෙන්න. |
| කසුන් | :- | බොහොම ස්තුතියි සර්. |
| විදුහල්පතිතුමා | :- | ස්තුතියි. |

(ලකුණු 2 × 5 = 10 යි)

www.pastpapers.wiki